**දැන්වීමයි**

**තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී පුරප්පාඩු පිරවීම**
**(අනුප්‍රාප්තිකයකු රහිත පදනම මත)**

**මැතිවරණ කොමිෂන් සභාව**
**සරණ මාවත, රාජගිරිය**

දැනට පුරප්පාඩු වී පවතින ඉහත සඳහන් තනතුරු පුරප්පාඩු 05ක් සඳහා රාජ්‍ය ආයතන වල සේවය කරන නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**වයස් සීමාව :** වයස අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**රාජකාරී ස්වභාවය :**

- ඉහත සඳහන් සියළුම තනතුරු මැතිවරණ කොමිෂන් සභාවේ රාජගිරියේ පිහිටි ප්‍රධාන කාර්යාලයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශයේ පවතී. එබැවින් කොළඹ දිස්ත්‍රික්කය තුළ පදිංචි ඉල්ලුම්කරුවන් සඳහා ප්‍රමුඛතාවය දෙනු ලැබේ.

- මැතිවරණ කොමිෂන් සභාව මඟින් පවත්වගෙන යනු ලබන දත්ත මධ්‍යස්ථානය, පරිගණක දත්ත ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, වී.පී.එන් ජාලය සහ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවල පිහිටුවා ඇති පරිගණක ජාල සහ අදාළ පරිගණක උපකරණ නිසි පරිදි පවත්වාගෙන යෑම.

- MS Windows Advance Server, Linux සහ VMware භාවිතය පිළිබඳ හැකියාව

- මැතිවරණ කොමිෂන් සභාවේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය විසින් සංවර්ධනය කර ඇති සහ බාහිර පාර්ශ්ව විසින් සංවර්ධනය කර පවත්වා ගෙන යනු ලබන පරිගණක වැඩසටහන් වැඩිදියුණු කිරීම සහ නඩත්තු කටයුතු ඉටු කිරීම.

- මැතිවරණ කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන නව පරිගණක පද්ධති සංවර්ධනය කිරීම සහ පවත්වාගෙන යාම.

- මෙයට අමතරව, ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවා ව්‍යවස්ථාවේ 04 සහ පළවෙනි උපලේඛනයේ අංක 1.1 සහ 1.2 කෙරෙහි ඔබගේ අවධානය යොමු කළ යුතුවේ.

**පොදු කොන්දේසි :**

- අයදුම්කරු 2 වන පන්තියේ අදාළ ශ්‍රේණියට අයත් කාර්යක්ෂමතා කඩඉම් විභාගය නියමිත කාල සීමාව තුළ සමත් වී තිබිය යුතුය.

- අවම වශයෙන් වසර 03කට නොඅඩු කාලයක් මැතිවරණ කොමිෂන් සභාවේ සේවය කිරීමට එකඟ විය යුතුය.

- මැතිවරණ කොමිෂන් සභාවට ස්ථාන මාරු වීම් ලබා පැමිණීමේදී නිලධාරියාගේ මූලික වැටුපෙන් 25% ක අමතර දීමනාවක් මාසිකව ගෙවනු ලැබේ.

- ආයතන සංග්‍රහයේ XXXII පරිච්ඡේදයේ 1.1 අනුව මැතිවරණ කොමිෂන් සභාවේ නිලධාරීන් හට දේශපාලන අයිතිවාසිකම් භුක්ති විඳීමට හිමිකමක් නොමැත.

- අයදුම්කරුගේ පවුලේ සාමාජිකයකු හෝ කලත්‍රයාගේ පවුලේ සාමාජිකයකු ක්‍රියාකාරී දේශපාලන කටයුතුවල යෙදී නොමැති තැනැත්තකු විය යුතුය.

- මැතිවරණයක් පවත්වන කාල සීමාව තුල සාමාන්‍ය රාජකාරී වේලාවට අමතරව සති අන්ත සහ රජයේ නිවාඩු දින වලද අදාළ රාජකාරි ඉටු කිරීම කළ යුතුය.

- පවරනු ලබන රාජකාරී ඉටු කිරීම සඳහා දිවයිනේ ඕනෑම මැතිවරණ කාර්යාලක් සඳහා යාම/ඒම සිදුකළ යුතුය.

- රාජකාරියකට අදාළ කෙටි කාලීන පුහුණුවකට පසුව තම කාර්යයන් ස්වාධීනව සහ කාර්යක්ෂමව ඉටු කිරීමට හැකියාව තිබිය යුතුය.

- රාජකාරී අවශ්‍යතාවයන් සඳහා ඉංග්‍රීසි භාෂාව නිවැරදිව යොදාගැනීමට හැකිවිය යුතුය.

**අයදුම්පත් ඉදිරිපත් කිරීම :**

මේ සමඟ අමුණා ඇති අයදුම්පත්‍රය සම්පූර්ණ කර දැනට සේවය කරන ආයතන ප්‍රධානියාගේ අනුමැතිය සහිතව ජීව දත්ත පත්‍රිකාව සමඟ ලියාපදිංචි තැපැල මඟින් පහත සඳහන් ලිපිනයට වර්ෂ 2023 අගෝස්තු මස 25 වන දින හෝ ඊට පෙර ලැබීමට සැලැස්විය යුතුය. එහි වම් පස ඉහළ කෙළවරේ "තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී තනතුර සඳහා" යන්න සටහන් කළ යුතුය.

**මැතිවරණ කොමසාරිස් ජනරාල්**<br>
**මැතිවරණ මහලේකම් කාර්යාලය**<br>
**සරණ මාවත,**<br>
**රාජගිරිය.**

මැතිවරණ කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන කමිටුවක් මඟින් අදාළ සුදුසුකම් පරීක්ෂා කර බලා සුදුසුකම් සහිත අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

ඒ අනුව සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය මඟින් නිපුණතා පරීක්ෂා කර බලා සුදුසු නිලධාරීන් බඳවා ගැනීම සඳහා රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත අයදුම්කරුගේ ආයතන ප්‍රධානියාට ද පිටපතක් සහිතව ලිඛිතව දන්වනු ලැබේ.

මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධව අවසාන තීරණය මැතිවරණ කොමිෂන් සභාව සතු වන අතර, සියළුම අයදුම්කරුවන් මෙම නිවේදනයේ සඳහන් පොදු නීතිරීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

මැතිවරණ කොමිෂන් සභාවේ නියමය පරිදි,

**සමන් ශ්‍රී රත්නායක**<br>
**මැතිවරණ කොමසාරිස් ජනරාල්**

2023 ජූලි මස 25 දින

මැතිවරණ මහලේකම් කාර්යාලය<br>
සරණ මාවත,<br>
රාජගිරිය.

## මැතිවරණ කොමිෂන් සභාව - ස්ථානමාරු සඳහා අයදුම්පත (අනුප්‍රාප්තිකයකු රහිත)

| | | | |
|---|---|---|---|
| **තනතුර** | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරි | **පන්තිය** | |

**අ. පෞද්ගලික තොරතුරු**

| | | |
|---|---|---|
| 01. සම්පූර්ණ නම : | | |
| 02. මුලකුරු සමග නම : | | |
| 03. උපන් දිනය : (අවු/මාස/දින) | 04. වයස:(2023.08.25 දිනට) (අවු/මාස/දින) | 05. ස්ත්‍රී / පුරුෂ භාවය: ස්ත්‍රී ☐ පුරුෂ ☐ |
| 06. ජාතික හැඳුනුම්පත් අංකය : | | |
| 07. පෞද්ගලික ඊ-තැපැල් ලිපිනය : | 09. ස්ථිර ලිපිනය : | 10. තාවකාලික ලිපිනය: |
| 08. ජංගම දුරකථන අංකය: | | |
| 11. විවාහක අවිවාහක බව: විවාහක ☐ අවිවාහක ☐ | 12. විවාහක නම් කලත්‍රයාගේ නම : | 13. කලත්‍රයාගේ රැකියාව හා සේවා ස්ථානය : |

**ආ. සේවා තොරතුරු**

| | |
|---|---|
| 14. වර්තමාන සේවා ස්ථානය : | 15. ස්ථිර කර තිබේද? ඔව් ☐ නැත ☐ |
| 16. සේවා ස්ථානය පිහිටි දිස්ත්‍රික්කය/නගරය : | 17. කාර්යාලයීය දුරකථන අංකය: |

| 18. වර්තමාන තනතුරේ සේවා කාලය:(2023.08.25 දිනට) | 19. ප්‍රතිලාභ ලබන (ප්‍රියමනාප) සේවා ස්ථානයකසේවය කර තිබේද?<br>ඔව් ☐<br>නැත ☐ | 20. ප්‍රතිලාභ ලබන (ප්‍රියමනාප) සේවා ස්ථානයකසේවය කර තිබේ නම් වර්ෂ කීයද? |
|---|---|---|
| | | |

| | | සේවා ස්ථානය | තනතුර | සේවා කාලය | |
|---|---|---|---|---|---|
| | | | | සිට | දක්වා |
| 21. රාජ්‍ය සේවයේ පූර්ව සේවා ස්ථාන : | 1 | | | | |
| | 2 | | | | |
| | 3 | | | | |
| | 4 | | | | |

මෑතකදී සකස්කරන ලද ජීව දත්ත පත්‍රිකාවක් සමග තොරතුරු තාක්ෂණ භාවිතය පිළිබඳ පුහුණු පාඨමාලා සහ වෘත්තීය සුදුසුකම් වලට අදාල සහතික පත්‍රවල ඡායා පිටපත් මේ සමග අමුණා ඇත.

ඉහත දක්වා ඇති තොරතුරු සියල්ල සත්‍ය හා නිවරදි බව ප්‍රකාශ කරමි.

....................................... ..............................................

දිනය අත්සන

ඇ. <u>අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය</u>

ඉහත නම සඳහන් නිලධාරියාගේ ස්ථාන මාරු ඉල්ලීම අනුප්‍රාප්තිකයෙකු රහිතව පදනම මත නිර්දේශ කරමි. මැතිවරණ කොමිෂන් සභාවේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් තෝරාගනු ලැබූ දින සිට මසක් ඇතුලත අදාල නිලධාරියා නිදහස් කිරීමට එකඟ වෙමි / එකඟ නොවෙමි.

............................. ..............................................

දිනය අත්සන

නිල මුද්‍රව

**සටහන : අවශ්‍ය ස්ථානවල** √ **හෝ** X **යොදන්න.**